# විශ්වවිද්‍යාල රෝහල
# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## <u>පුරප්පාඩු – ස්ථිර පදනම මත</u>

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලෙහි පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>වෛද්‍ය නිලධාරි</u>**

1. **<u>වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය</u>**

**සුදුසුකම්:**

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල II ශ්‍රේණිය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද ලබා තිබීම.

සහ

III. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම.

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:**

MO 1-1 රු.(101,610 - 3 × 2,480 - 7 × 2,490 - 2 × 3,450 - 10 × 4,100 - 174,380)
*වෛද්‍ය නිලධාරි – I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ රු.137,480.00 + අනුමත අනෙකුත් දීමනා.

## 2. <u>වෛද්‍ය නිලධාරි - II ශ්‍රේණිය</u>

**සුදුසුකම්:**

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන රෝහලක අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබීම.

සහ

III. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:**

MO 1-1 රු.(101,610 - 3 × 2,480 - 7 × 2,490 - 2 × 3,450 - 10 × 4,100 - 174,380)
*වෛද්‍ය නිලධාරි – II ශ්‍රේණිය MO 1-1 පියවර 05 හි තබනු ලැබේ.රු.111,540.00 + අනුමත අනෙකුත් දීමනා.

## 3. <u>වෛද්‍ය නිලධාරි - ප්‍රාථමික ශ්‍රේණිය</u>

**සුදුසුකම්:**

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:**

MO 1-1 රු.(101,610 - 3 × 2,480 - 7 × 2,490 - 2 × 3,450 - 10 × 4,100 - 174,380)
* වෛද්‍ය නිලධාරි – ප්‍රාථමික ශ්‍රේණිය MO 1-1 පියවර 02 හි තබනු ලැබේ - රු. 104,090.00 + අනුමත අනෙකුත් දීමනා.

**<u>හෙද නිලධාරි</u>**

1. **<u>හෙද නිලධාරි - III ශ්‍රේණිය</u>**

**සුදුසුකම්:**

I. සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය මගින් හෝ හෙද සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක හෙද ඩිප්ලෝමා පාඨමාලාව හෝ උපාධිය සම්පූර්ණ කර තිබීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවට අයත්, ජීව විද්‍යාව/ගණිතය/කෘෂි විද්‍යාව විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම. පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්වීම.

සහ

III. සිංහල / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 7 - රු.(55,910 - 10 × 800 - 11 × 1,190 - 10 ×1,320 - 10 × 1,350 -103,700)
*හෙද නිලධාරි – III ශ්‍රේණිය MT 7 පියවර 01 හි තබනු ලැබේ. - රු. 55,910.00 + අනුමත අනෙකුත් දීමනා.

**<u>පොදු කොන්දේසි</u>**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්වවිද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන දිවයිනේ ඕනෑම ස්ථානයක හෝ සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

4. අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.

5. මෙම තනතුරු ස්ථිර වන අතර, වෛද්‍ය නිලධාරි ප්‍රාථමික ශ්‍රේණිය හා අනෙකුත් තනතුරු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය, වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය තනතුරුවල රාජ්‍ය සේවයෙහි රැකියාවක නියුතුව සිටි නිලධාරින් වසර එකක (01) පරිවාස කාලයකට යටත් වේ.

6. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද දරන අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරනු ලැබේ (පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව).

7. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයක් සමඟින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතිකවල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2025.08.18** දිනට හෝ ඊට පෙර "විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

8. අයදුම්කරුවන් කෙටි ලයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

9. අසම්පූර්ණ, ප්‍රමාද වී ලැබුණු සහ අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. අයදුම්පත් භාගත කර ගැනීමට/ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට (www.kdu.ac.lk) පිවිසෙන්න.

**www.kdu.ac.lk**